දිවි මගට දහම් බිඳක්......

# පිවිතුරු ප්‍රතිපදාවෙන් සම්මාසම්බුද්ධත්වයට

## (ලක්ඛණ සූත්‍රය ඇසුරිනි)

පූජ්‍ය වැලිමඩ පසන්නමානස හිමි

ධර්මදානය පිණිසයි
2561 වෙසක්
2017 මැයි

ප්‍රථම මුද්‍රණය - 2010 වෙසක්
දෙවන මුද්‍රණය - 2017 වෙසක්

ප්‍රකාශනය :
ධර්මාභිසමය ධර්ම පුස්ථක ප්‍රකාශක මණ්ඩලය
කිතුල්ගොඩ අරණ්‍ය සේනාසනය,
කිතුල්ගොඩ,
අගලවත්ත.
දු.ක. 034 3309708.

මුද්‍රණය : දිමුතු මුද්‍රණාලය
අංක 103/A, නුවර පාර, යක්කල.
දුරඃ 033-2239662 / 077-8829705
විද්‍යුත් තැපෑලඃ dimuthupub@yahoo.com
දහම් පොත් කියවීම සඳහා පිවිසෙන්න.
වෙබ්ඃ www.dhammadanabooks.com

## ආරම්භයට වචනයක්........

සම්මාසම්බුදුරජාණන් වහන්සේ නමක් ලෝකයේ පහළ වීම අතිශයින් ම දුර්ලභ කරුණකි. ඒ බුදුරජාණන් වහන්සේ සෑම තැන්හි ම පහළ නො වෙති. ඒ මහා ප්‍රඥාවන්ත බුදුරජාණන් වහන්සේ යම් කුලයක උපදී ද එම කුලයට සැප ගෙන දෙන්නේ ය, යන උතුම් බුදු වදන සිහිපත් කරන විට බුදුරජාණන් වහන්සේ පිළිබඳව අපමණ ශ්‍රද්ධාවක් ඇතිකර ගත හැකි ය. බුදුරජාණන් වහන්සේගේ අසීමිත සම්මාසම්බුදු ගුණයන් නිරන්තරයෙන් සිහිපත් කරමින් ලොව යමෙක් වාසය කරයි ද, ඒ තුළින් රැස්වන කුසලය පමණ කල නො හැකි ය.

මේ උතුම් කුසලය රැස් කිරීම පිණිස ඒ සම්මාසම්බුදු ගුණයෙන් බිඳක් හෝ දැන සිටීම යහපතක් ම වන්නේ ය. ඒ තුළින් සීල, සමාධි, ප්‍රඥා යන මඟ වඩමින් ආර්ය සත්‍ය අවබෝධය පිණිස කටයුතු කළ හැකි ය.

ඒ උතුම් සම්මාසම්බුදු ගුණයන් පිළිබඳව දේශනා කළ සූත්‍ර දේශනා අපමණ ය. ඒ අතරින් ඉතාම වැදගත් සූත්‍ර දේශනාවක් වන ''**දීඝ නිකායේ ලක්ඛණ සූත්‍රය**'' ඇසුරෙන් ''**දිවිමගට දහම් බිඳක්**'' පොත් පෙළේ ''**පිවිතුරු ප්‍රතිපදාවෙන් සම්මාසම්බුද්ධත්වයට**'' යන පොත සකස් කිරීමෙන් ද බලාපොරොත්තු වන්නේ බුදුරජාණන් වහන්සේ පිළිබඳව ශ්‍රාවකයින්ගේ ශ්‍රද්ධාව දියුණු කිරීම ය.

මේ උතුම් ධර්ම ග්‍රන්ථය හොඳින් කියවා බුදුරජාණන් වහන්සේ පිළිබඳව අපමණ ශ්‍රද්ධාව දියුණු කොට බුද්ධිමත් ශ්‍රාවක චරිතයක් ගොඩනඟා ගෙන ආර්ය සත්‍ය අවබෝධ කොට ඉතා ඉක්මනින්ම මේ භයානක දුක් සහගත සසරින් එතෙර වන්නට අප්‍රමාදීව කටයුතු සලසා ගනිත්වා ! යි මෙත් සිතින් ප්‍රාර්ථනා කරමි.

තවද මේ උතුම් ග්‍රන්ථය සම්පාදනය කිරීමෙහිලා ඉමහත් සහයෝගයක් ලබාදුන් සියලු සොයුරු, සොයුරියන්ටත් දායකත්වය දැක්වූ සැමටත් සෝභන ලෙස පිට කවරය සකසා දුන් සැම දෙනාටත්, මුද්‍රණ කටයුතු සිදු කර දුන් මුද්‍රණාලයේ අධිපති තුමා ඇතුලු සියලු සේවක මහත්ම, මහත්මීන්ටත්, තුණුරුවන්ගේ අනන්ත ගුණ බල මහිමයෙන් සීල, සමාධි, ප්‍රඥා මග වඩමින් උතුම් වූ ධර්මාවබෝධය ලබාගෙන මේ සසර දුකින් එතර වීමට සියලු ශක්තිය, ධෛර්ය ලැබේවා! යි මෙත් සිතින් ප්‍රාර්ථනා කරමි.

සැමට තෙරුවන් සරණයි !

මෙයට,<br>
මෙත් සිතැති,<br>
වැලිමඩ පසන්නමානස ස්ථවිර.

ප්‍රධාන අනුශාසක ස්වාමීන් වහන්සේ<br>
කිතුල්ගොඩ අරණ්‍ය සේනාසනය<br>
කිතුල්ගොඩ,<br>
අගලවත්ත.

**ශ්‍රී.බු.ව. 2560 (2017) වෙසක් මස (මැයි) 08.**

# පිවිතුරු ප්‍රතිපදාවෙන් සම්මාසම්බුද්ධත්වයට

සම්මාසම්බුදුරජාණන් වහන්සේ නමක් ලෝකයේ පහළ වන්නේ ඉතාම කලාතුරකිනි. ඒ පහළවීම අතිශයින් ම සුන්දර මෙන්ම ආශ්චර්ය අද්භූත දෙයකි. ඒ අසිරිමත් පහළවීම සියලු දෙවි-මිනිසුන්ට ම අතිශය සැප ගෙන දෙන්නකි. සාරාසංඛ කල්ප ලක්ෂයක් පෙරුම් පුරා සම්මාසම්බුද්ධත්වය සඳහා පැමිණි ගමනේදී කිසිදු කෙනෙකුට ලඟා වීමට නොහැකි කළා වූ අතිශය පුණ්‍යමහිමය නිසා තිස් දෙකක් වූ මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් සෝභමාන වූ, දකින සියලු දෙනාටම යළි යළි ප්‍රිය උපදවන රූප කායකින් සමන්විත වූයේ ය.

බුදුරජාණන් වහන්සේ සම්මාසම්බුද්ධත්වයට පත් වී විවිධ අවස්ථාවලදී අසිරිමත් සම්මාසම්බුදුගුණ ගැනත්, ඉපදීමේ සිට පිරිනිවන්පාන තෙක් සිදුවූ සුවිශේෂී සිදුවීම් පිළිබඳවත්, බෝධිසත්ත්ව සමයේ කළා වූ මාහැඟි පින්කම් පිළිබඳවත්, අතිශය මනරම් සුවිශේෂී අවබෝධාත්මක දේශනා පැවැත්වූ සේක. ඒ අතර අච්ඡරියබ්භූත සූත්‍රය, මහාසීහනාද සූත්‍රය, කාළකාරාම සූත්‍රය, ලක්ඛණ සූත්‍රය, ආනන්ද සූත්‍රය ආදී තවත් බොහෝ සූත්‍ර දේශනා හඳුන්වා දිය හැකිය.

මෙසේ ඒ උතුම් සම්මාසම්බුදුගුණ මොනතරම් ද යත්, බුදුරජාණන් වහන්සේ එක් අවස්ථාවක මෙසේ දේශනා කළ සේක.

මහණෙනි, තථාගතයන් වහන්සේ වෙන කිසිදු ධර්මයක් පිළිබඳව දේශනා නොකොට කල්පයක් බුදුගුණ දේශනා කළොත් කල්පය අවසන් වනවා විනා බුදුගුණ අවසන් නොවන බවයි. අපට සිතාගැනීමටවත් නොහැකි අනන්ත සම්මාසම්බුදුගුණ ඒ තථාගතයන් වහන්සේ කෙරෙහි ගැබ්ව ඇත. ඒ අනන්ත සම්මාසම්බුදුගුණ නිතර

මෙනෙහි කොට භාවනා වශයෙන් ප්‍රගුණ කරන්නේ නම් සියලු ක්ලේෂයන්ගෙන් නිදහස් වීමට එය උපකාරයක් වන බව බුදුරජාණන් වහන්සේම දේශනා කළ සේක.

**''ඒකධම්මෝ, භික්ඛවේ, භාවිතෝ බහුලීකතෝ ඒකන්තනිබ්බිදාය විරාගාය නිරෝධාය උපසමාය අභිඤ්ඤාය සම්බෝධාය, නිබ්බානාය සංවත්තති. කතමෝ ඒකධම්මෝ? බුද්ධානුස්සති''**

මහණෙනි, එකම ධර්මයක් භාවනා වශයෙන් වඩන ලද්දේ, බහුල වශයෙන් වඩන ලද්දේ, ඒකාන්තයෙන්ම, සසර කලකිරීම පිණිස, සසර නො ඇලීම පිණිස, රාගාදීන්ගෙන් නිදහස්වීම පිණිස, කෙලෙසුන්ගෙන් නිදහස්වීම පිණිස, ආර්ය සත්‍ය අවබෝධය පිණිස උතුම් නිවන සාක්ෂාත් කිරීම පිණිස බුද්ධානුස්සතිය හේතු වේ.

බලන්න පින්වතුනි, සර්වාකාරයෙන් බුදුගුණ මෙනෙහි කිරීමෙන් ම අපිට කොච්චර ධර්ම මාර්ගයේ ඉහලට යන්න පුළුවන් ද කියලා. මේ සියලු කරුණු පදනම් කරගෙන බුදුරජාණන් වහන්සේ පිළිබඳව තිබෙන අවබෝධය වැඩි කිරීම පිණිසත් බුදුරජාණන් වහන්සේ බෝධිසත්ත්ව කාලයේ සිදු කළ මහා ප්‍රඥා බලමහිමය නිසා ඇති වූ තිස්දෙකක් මහා පුරිස ලක්ෂණ පිළිබඳවත් ඒ සඳහා අනුගමනය කළ සියලු ප්‍රතිපත්තීන් පිළිබඳව විස්තරවන ඉතාම වටිනා සූත්‍ර දේශනාවක් මේ පින්වතුන්ට පැහැදිලි කර දීමට බලාපොරොත්තු වන්නේ.

මේ උතුම් දේශනාව අඩංගු වන්නේ දීඝ නිකායේ පාථිකවග්ගයට. සූත්‍රයේ නම ලක්ඛණ සූත්‍රයයි. බුදුරජාණන් වහන්සේ අනාථපිණ්ඩික සිටුතුමාගේ ආරාමෙහි වැඩ සිටින දිනයක භික්ෂූන් වහන්සේලා අමතා මේ උතුම් සූත්‍ර දේශනාව ඉතාම පැහැදිව දේශනා කළ සේක.

## නියත වූ කාරණා දෙකකි

**''ද්වත්තිංසිමානි භික්ඛවේ මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණානි යෙහි සමන්නාගතස්ස මහාපුරිසස්ස ද්වේව ගතියෝ භවන්ති අනඤ්ඤාඃ සචෙ අගාරං අජ්ඣාවසති රාජා හෝති චක්කවත්තී ධම්මිකෝ ධම්මරාජා චාතුරන්තෝ විජිතාවී ජනපදත්ථාවරියප්පත්තෝ සත්තරතනසමන්නාගතෝ''**

මහණෙනි, තිස් දෙකක් වූ මහා පුරුෂ ලක්ෂණ යන්ගෙන් සමන්විත වූ මහා පුරුෂයෙක් වේද, නියත වශයෙන් ම දස කුසලයෙන් රට රකින්නා වූ චක්‍රවර්තී රජෙක් බවට පත්වේ. නැත හොත් **'සචෙ බෝ පන අගාරස්මා අනගාරියං පබ්බජති අරහං හෝති සම්මාසම්බුද්ධෝ ලෝකේ විවත්තච්ඡදෙ'** ගිහිගෙයින් නික්ම පැවිදි වන්නේ නම්, සියලු කෙලෙසුන් නසා, දෙව් මිනිසුන් ඇතුළු සියලු සත්ත්ව ප්‍රජාව ම සසර දුකින් එතර කිරීම පිණිස සම්මාසම්බුද්ධත්වයට පත්වන්නේ ය.

## කවුද ඒ සක්විති රජතුමා

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, දෙතිස් මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් සමන්විත වූ මහා පුරුෂයෙකු විසින් දස කුසලයෙන් රට පාලනය කරමින් දහමෙන් යුක්තව, සිවුසයුරට ම අධිපති ව, සතුරන් නැති තමන් පාලනය කරන ප්‍රදේශය ඉතා හොඳින් තහවුරු බවට පත්කරගත් සම්පත් සතක් පරිපූර්ණ වූ රජෙක් වන්නේ ය.

## කුමක්ද මේ සත්රුවන?

1. චක්‍ර රත්නය
2. හස්ති රත්නය
3. අශ්ව රත්නය
4. මාණික්‍ය රත්නය
5. ස්ත්‍රී රත්නය
6. පරිනායක රත්නය
7. පුත්‍ර රත්නය

යන මේ රත්නයන් සත චක්‍රවර්ති රජතුමාට නො අඩුව ලැබෙන අතර, ශූර-වීර රුව සම්පන්න සතුරන් දිණිය හැකි ඉතාම නුවණැති පුත්තු දහසක් ලැබේ. මේ මහා පොළොව දඬුවමින් තොරව අවියෙන් තොරව දැහැමිව දිනා අධිපතිව වෙසෙයි.

**මොනවද මේ මහා පුරුෂ ලක්ෂණයන් ?**

සසුනෙන් බැහැර ඍෂිහුට ද මේ මහා පුරුෂ ලක්ෂණ පිහිටයි.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, **''ඉමානි ඛෝ භික්ඛවේ ද්වත්තිංස මහාපුරිසස්ස මහාපුරිසලක්ඛණානි බාහිරකා පි ඉසයෝ ධාරෙන්ති. නො ච ඛෝ තේ ජානන්ති 'ඉමස්ස කම්මස්ස කතත්තා ඉමං ලක්ඛණං පටිලභන්තී'ති.''**

මහණෙනි, මේ මහා පුරුෂ ලක්ෂණ බාහිර ඍෂිහුට ද පිහිටත්, එය කර්මයන්ට අනුකූලව ලැබෙන පිහිටන දෙයකි.

**එක් එක් මහා පුරුෂ ලක්ෂණ පහළ වීමට හේතුව සහ සිදුකළ උතුම් කර්මයන්.**

බුදුරජාණන් වහන්සේ ඉතාම පැහැදිලිව දේශනා කරනවා එක් එක් මහා පුරුෂ ලක්ෂණයන් පහළ වීමට හේතුවන්නේ විවිධාකාරයෙන් සම්පූර්ණ කරගත් උතුම් කර්මයන් බව.

**1. සුපිහිටි පාද ලක්ෂණය සහ එය පිහිටීමට හේතු.**

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා පෙර මිනිස් භවයන්හි ඉපිද කුසල් දහම් බොහෝ කොට කාය සුචරිතයෙන්, වාග් සුචරිතයෙන්, මනෝ සුචරිතයෙන් යුක්තව, තමාට ලද කොටස බෙදාගනිමින් වැළඳීමෙන්

ද, පන්සිල් සමාදන්ව මනාව ආරක්‍ෂා කිරීමෙන් ද, පෙහෙවස් සමාදන්වීමෙන් ද, මවට-පියාට කළ යුතු සියලු සත්කාරයන් සිදු කරමින් ද, මහණ බමුණන්ට කළ යුතු සියලු සත්කාරයන් සිදු කොට, කුල දෙටුවන් පුදමින් ද තවත් කළ යුතු බොහෝ කුසල කර්මයන් පුන පුනා සිදු කළ බැවින් මරණයෙන් මතු සෝභන වූ දෙව්ලොව ඉපදී එහි දෙවියන්ට අවශ්‍යය දෙව් පැහැයෙන් ද, දෙව් සැපයෙන් ද, දෙව් යසසින් ද, දෙව් අධිපති බවින් ද, දෙව් රුවනින් ද, දෙව් හඬින් ද, දෙව් සුවඳින් ද, දෙව් රසයෙන් ද, දෙව් පහසින් ද යන දස කරුණෙන් අන් දෙවියන් ඉක්මවා යයි. අනතුරුව මේ මිනිස් භවයට පැමිණ මේ මහා පුරුෂ ලක්‍ෂණය ලැබීය. ගිහි ව වසන්නේ නම් දස කුසලයෙන් රට පාලනය කරයි. ගිහිගෙයින් නික්ම පැවිදි වූයේ නම් සියලු දෙවියන්, බඹුන්, මිනිසුන් ඉක්මවා සම්මාසම්බුද්ධත්වයට පත්වෙයි.

රන් මිරිවැඩි පතුලට සම වූවා
උත්තම සිරිපා සුසිනිඳු වූවා
කුණු රොඩු ගල් කැට ඉවතට වූවා
සමිඳු වඩින මග පිරිසිඳු වූවා

අතහිත දීමෙන් අන් අය සැලකීම ට
කල්ප ගණන් වැඩහිට සැලකීම ට
මව්පිය උවටැන් කළ පින් මහිමෙ ට
මුළු සිරිපතුල ම ගැවෙයි පොලොව ට

## 2. පාදතලයන් හී චක්‍ර ලක්‍ෂණය හා එය පිහිටීමට හේතු.

බුදුරජාණන් වහන්සේ පෙර භවයන්හි දී, සොර ආදීන්ගෙන් වන බිය ද, යක්ෂ ආදීන්ගෙන් වන බිය ද, දුරු කරමින් බොහෝ දෙනාගේ හිත සුව පිණිස කටයුතු කරමින් පිරිස් එකතු කර ගනිමින් දන් දෙමින්, අප්‍රමාණ ව මේ කර්මයන් සම්පූර්ණ කළ බැවින් මරණින් මතු

සෝභන ගති ඇති දිව්‍ය ලෝකයේ ඉපිද එයින් චුත ව මනුෂ්‍යලෝකයේ ඉපිද, මේ මහා පුරුෂ ලක්‍ෂණය ලැබීය. ගිහිගෙහි වසන්නේ නම් සියලු සම්පතින් පිරිපුන් සක්විති රාජ්‍ය ලබයි. එමෙන්ම පිරිවර ලබයි. ඒ පිරිවර අතර, බමුණන් හා ගැහැවියෝ ද, ගම් වැසියෝ සහ දනව් වැසියෝ ද, රජුගේ අය වැය ගණින්නන් ද මහා ඇමතියෝ ද, පිරිස ආරක්‍ෂා කරන ඇමතියෝ ද, දොරටු පාලකයෝ ද, පරපුරෙන් ම රජ පිරිස වූ ඇමතියෝ ද, රජ දරුවෝ ද, ගම් මුදලියෝ ද, රජ කුමාරයෝ ද යන මහත් පිරිවර ද ලබයි.

ගිහිගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සියලු කෙලෙසුන් නසා සම්මාසම්බුද්ධත්වයට පත්වන්නේ ය. එමෙන්ම මහා පිරිවර ද, ශ්‍රාවක භික්‍ෂූන් වහන්සේලා ද, ශ්‍රාවක භික්‍ෂුණීන් වහන්සේලා ද, උපාසක-උපාසිකාවන් ද, දෙව් මිනිසුන් ද, අසුරයෝ ද, නාගයෝ ද, ගන්ධබ්බයෝ ද යන මහා පිරිවරින් සමන්විත වෙයි.

රියසක රූපය ඇති හිමි දෙපතු ල
හැඩ වැඩ කරනා සත්ව රූප පෙ ළ
දෙව් ලොව හා බඹ ලොව ඇති මංග ල
ලකුණු පිරී ඇති සිරිපා නිර්ම ල

පර හිතකාමී ලෙස බෝසත් කල
ඉටුකළ යුතුකම් පුරවා මන දොළ
දන්දීමෙන් ලැබූ කුසලෙහි පින් බල
මහිමය පෙන්වයි සලකුණු මංගල

### 3-4-5. දික් විලුඹ, දික් ඇඟිලි සහ බඹයක් පමණ වූ ශරීර ලක්‍ෂණ සහ ඒවා පිහිටීමට හේතු

බුදුරජාණන් වහන්සේ පෙර මිනිස් භවයන්හිදී ප්‍රාණඝාතාදියෙන් වෙන්ව, ප්‍රාණඝාතය කරන යම් දඬු මුගුරු අවි ආයුධ වේ ද, සියල්ල ඉවත් කර සත්ත්ව

ඝාතනයෙන් ලැජ්ජා සහගතව සියලු සත්ත්වයින් කෙරෙහි හිතානුකම්පිතව වාසය කරමින් මෙබඳු උසස් කර්මයන් හී අප්‍රමාදීව කටයුතු කළ බැවින් මරණින් මතු සෝභන වූ දිව්‍ය ආත්මයන්හී පහළ වී ඉන්පසු මිනිස් ආත්මයට පැමිණ මේ මහා පුරුෂ ලක්ෂණ ලැබූහ. ගිහිගෙයි වසන්නේ නම් සියලු සැප සම්පතින් පරිපූර්ණ වූ චක්‍රවර්තී රාජ්‍ය උසුලන්නේ ය. කිසිදු සතුරෙකුට දිවියෙන් තොර කළ නොහැකිය යන මෙබඳු උසස් සම්පත් ලබයි.

ගිහිගෙයින් නික්මී පැවිදි වන්නේ නම් සියලු දෙව් මිනිසුන්ට වඩා උසස් සම්මාසම්බුද්ධත්වයට පත්වේ. සම්මාසම්බුද්ධත්වයට පත් වී දීර්ඝ ආයුෂ ලබයි. දීර්ඝ ආයුෂ පාලනය කරන අතර කිසිදු සතුරෙකුට දිවි තොර කළ නො හැකි ය.

සිව් කොටසකට බෙදී පතුලෙහි සමිඳුන් ගේ
අන්තිම කොටසේ වටකුරුවට පිහිටි අගේ
දික්වුනු විලුඹ ලියැවුණු රන් කළය වගේ
පෙර පිනටයි ලැබුනේ බුදු හිමියන් ගේ

පාරමිතා පුරමින් හිමි බෝසත්
නිති සිදුකළ වැඩිහිටි සැලකීමත්
රෝගී දනට උවටැන් කළ පිහිටත්
ලැබඳුනි සමිඳුට සිරිපා සිව්මත්

පුරිස මහා ලකුණින් යුත් ඇඟිලි
රෝස මලේ රතු පැහැයෙන් සුදිලී
සමලෙස දික් වූ වටකුරු ඇඟිලි
කෙලවර සුසිනිඳු උස්නිය බැබලී

පෙර භවයේ ඇඳි මනහර සිතුවම්
පිළිම නෙළා පිරි අගනා කැටයම්
දන් සකසා පුදමින් කළ පින්කම්
කුසලයට හිමිවිය රතැඟිලි මනරම්

දිගු ලෙස උස්ව ඇති ඍජුකය මුනිඳුන් ගේ
සමවෙයි කෙලින් සිරුරට මහ බඹුන් ගේ
වියදඬු පමණ දුර බලමින් වඩින මගේ
සම්බුදු සමිඳු බැබලෙන රන් රුවක් වගේ

කැඩුණු බිඳුණු තැන් පිරියම් කරලා
පන්සල වෙහෙර ද පිරිසිදු කරලා
ජනසුව පිනිසම මං පෙත් හදලා
උස් වූ ඍජුකය මුනිඳුට ලැබිලා

**6. සප්ත උත්සද ලක්ෂණය හා එය ලැබීමට හේතු.**

බුදුරජාණන් වහන්සේ පෙර මිනිස් භවයන්හිදී ප්‍රණීත වූ රසවත්, කෑ හැකි, රස වින්ද හැකි, දිවෙන් රස විඳිය හැකි, අෂ්ඨ පාන ආදිය දෙන්නේ යන යමක් ඇද්ද ඒ කර්මයන් අප්‍රමාණව සිදුකළ බැවින්, මරණින් මතු සෝභන ගති ඇති දිව්‍ය ලෝකයෙහි ඉපිද එහි සැප සම්පත් විඳ එයින් චුතව මිනිස් ලෝකයෙහි ඉපිද මේ මහා පුරුෂ ලක්ෂණය පහළ වූයේ ය. එහිදී සත් තැනක පිරිපුන් මස් ඇති වෙයි. දෙ අත්ලෙහි පිරිපුන් මස් ඇති වෙයි. දෙපතුලෙත් පිරිපුන් මස් ඇති වෙයි. දෙ උරහිසෙත් පිරිපුන් මස් ඇති වෙයි. කරෙහි පිරිපුන් මස් ඇති වෙයි. ගිහිගෙයි වෙසෙන්නේ නම් සියලු සම්පත් පරිපූර්ණ වූ සක්විති රජවෙයි. බොහෝ රසවත් ප්‍රණීත කෑම බීම සියල්ල මනාව ලැබෙන සුළුවෙයි.

ගිහිගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සියලු කෙලෙසුන් නසා සම්මාසම්බුද්ධත්වයට පත්වන අතර සියලු සම්පතින් පරිපූර්ණ වූ ප්‍රණීත කෑම බීම සියල්ල මනාව ලැබෙන සුළුවෙයි.

උරහිස මෙන් ම පිට අල්ල ද හිමි දැතේ
කරවට මෙන් ම සිරිපා පිටි පතුල් මතේ
සත්තැන නහර නොපෙනී මස් පිරී ඇතේ
එයද පුරිස් ලකුණකි මුනිඳුන්ගේ ගතේ

ඉටුකරමින් සතහට යුතුකම්
ලෙසට මනා කරමින් සැලසුම්
සැමවිට සකසා කළ පින්කම්
ලැබදුනි සමිඳුට ගත මනරම්

**7-8. මොලොක් තරුණ අතුල් පතුල් ද දැල් කවුළුවකට බඳු අත්පා වලින් සමන්විත ලක්ෂණ සහ ඒවා පහළ වීමට හේතු.**

බුදුරජාණන් වහන්සේ පෙර මිනිස් භවයන්හිදී දානය, ප්‍රිය වචනය, සමානාත්මතාවය, අර්ථචරියාව යන සතර සංග්‍රහ වස්තූන්ගෙන් ජනයාට සංග්‍රහ කරමින් එබඳු කර්මයන් බෙහෝ පරිපූර්ණ ලෙස සම්පූර්ණ කළ බැවින් මරණයෙන් පසු සෝභන ගති ඇති දිව්‍ය ලෝකයන් හී ඉපිද, එයින් චුත ව මිනිස් භවයෙහි ඉපිද මේ මහා පුරුෂ ලක්ෂණයන්ගෙන් සමන්විත විය.

ගිහිගෙයි වසන්නේ නම් සියලු සම්පතින් පරිපූර්ණ වූ සක්විති රාජ්‍ය ලබයි. සක්විති රාජ්‍ය ලබා බොහෝ පිරිවර ජනයා ඇති වෙයි. බමුණු ගැමි ජනයා ද, නියම් වැසි දනව් වැසි ජනයා ද. රාජ්‍ය ගණන්හි සකස් කරන ජනයා ද, සේනාංක රකින හස්ති චාර්යයෝ ද, ඇමතියෝ ද, පරම්පරාගත රජ පිරිසෙහි වූවෝ ද, රජුගෙන් ලත් භෝග සම්පත් ද, රජ කුමරුවෝ ද, යන සියලු මිනිස් සම්පත් ලබන අතර ම බොහෝ පරිවාර ජනයා ද ලබයි.

ගිහිගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සියලු කෙලෙසුන් නසා සම්මාසම්බුද්ධත්වයට පත්වන්නේ ය. එහිදී ශ්‍රාවක භික්ෂු සංඝයා ද, ශ්‍රාවක භික්ෂුණී සංඝයා ද, උපාසක-උපාසිකාවෝ ද, මිනිස්සු ද, අසුරයෝ ද, නාගයෝ ද, ගන්ධබ්බයෝ ද යන සියලු පිරිසෙන් අප්‍රමාණ සංග්‍රහයන් ලබන්නේ ය.

අතපය මෙළෙකය බුදු හිමියන් ගේ
සමලෙස මොළකැටි කිරිදරුවෙකු ගේ
මුසුව ගිතෙල් ඇති පුලුන් රොද වගේ
පතුල අත්ල සිනිඳුය සමිඳුන් ගේ

සසර පුරා තම මව්පිය දෙපළ ට
අත පය වෙහෙසා උවටැන් පිදු මට
ලැබූ පිනෙන්, මල් මාලා පුද කොට
සුසිනිඳු අත් පා ලැබුණේ සමිඳු ට

මුනිඳුගේ සියුමැලි අත් පා ඇඟිලි
වටව සැදී ඔපවත් ලෙස සුදලී
සම ලෙස දික්වූ කැටයම් පිරි ලී
ඇතිව තැනූ කවුලුවෙ සිරි ඉසිලී

සිවු සංග්‍රහයෙන් පුදමින් සැමටම
රැස් කළ පින් කඳ සසරෙහි නෑරම
ලැබදුනි සමිඳුට පිරිවර සමඟම
මොලකැටි පැහැපත් අත් පා සිනිඳුම

**9-10. උස් වූ ගොප් ඇට ඇති පා සහ උඩුකුරුව යොමුවූ ලොම් ඇති ලක්ෂණ සහ ඒවා ඇති වීමට හේතු.**

බුදුරජාණන් වහන්සේ පෙර මිනිස් භවයන්හිදී බොහෝ පිරිසකට දෙලොව වැඩ සලසා දස කුසල කර්මයන් ඇසුරු කළ වචන ප්‍රකාශ කළ අතර සියලු සත්ත්වයන් හට දෙලොවට ම වැඩ සැලසූහ. ධර්ම දානය ආදී බොහෝ කර්මයන් අප්‍රමාණ සිදුකළ බැවින් මරණින් මතු දිව්‍ය ලෝකයෙහි ඉපිද එහි දී සෝභන වූ දිව්‍ය සම්පත් විඳ, එයින් චුතව මනුෂ්‍ය ලෝකයේ ඉපිද මේ මහා පුරුෂ ලක්ෂණ පහළ වූහ.

ගිහිගෙයි වාසය කරන්නේ නම් සක්විති රජබවට පත් වී සියලු සත්ත්වයින්ට වඩා අග්‍ර වූ ද, ශ්‍රේෂ්ඨ වූ ද, ප්‍රමුඛ වූ ද, උත්තම වූ ද වෙයි.

ගිහිගෙයින් නික්මී පැවිදි බවට පත් වේද සියලු කෙලෙසුන් නසා සම්මාසම්බුද්ධත්වයට පත් වී සියලු සත්ත්වයන්ට වඩා අග්‍ර වූ ද, ශ්‍රේෂ්ඨ වූ ද, ප්‍රමුඛ වූ ද, උත්තම වූ ද වෙයි.

ගොප් ඇට ඉහලින් පිහිටන සිරිපා
වළලුකර සවිමත් ඇති සිරිපා
සමිඳු වඩින විට තබමින් සිරිපා
පෙනෙයි පතුල් හැම දෙසටම හැඩපා

තිර වචනය හා නොවෙනස් පිළි වෙත
පෙරකල බෝසත් චරිත පුරා ඇත
බෙඳූ පිනෙන් දම් දැනුමක් සත වෙත
උස් වූ පා යුග ලැබුණේ මුනි වෙත

දකුණට කර කැවුණු වක් හැඩයගත් ලෝම
කෙලවර උඩට නැමි නිල් පැහැගත් ලෝම
වතෙහි මුනිඳුගෙ සිරි නරඹන ලෝම
ලකුණකි පුරිස් භවගත් සමිඳුට උරුම

මිනිසෙකු වී ඉපදුන කල සසරෙ හි
සතවෙත පතුරා එළියක් දහමෙ හි
ජයගැනුමට දී ඔවදන් දෙලොවෙ හි
උඩුකුරු ලොම් විය මුනිඳුගෙ සිරුරෙ හි

**11. ඕලු මුවන්ගේ බඳු කෙණ්ඩා ඇති ලක්ෂණය සහ එය පහළවීමට හේතු.**

බුදුරජාණන් වහන්සේ පෙර මිනිස් භවයන්හිදී දැන ගත යුතු ශිල්ප, විද්‍යා, ශීලය, කර්මය මනාව දැනගත් අතර, බොහෝ කල් නොයවා හදාල යුතු ශිල්පයන් සකසා ඉතාම පිළිවෙළකට ඒ සියලු ශිල්පයන් සම්පූර්ණ කලහ. මේ සියලු කර්මයන් පුන පුනා සම්පූර්ණ කළ බැවින් මරණයෙන් මතු මනා සෝභන ගති ඇති දිව්‍ය ලෝකයෙහි ඉපිද එහි සැප සම්පත් විඳ එයින් චුත ව මිනිස් ලෝකයට පැමිණ මේ මහා පුරුෂ ලක්ෂණය ලැබීය.

ගිහිගෙයි වසන්නේ නම් සියලු සම්පතින් පිරි සක්විති රාජ්‍ය ලබන අතර සක්විති රජුට සුදුසු ඇත් අස් ආදී යාන ද, රජුනට අවශ්‍ය සේනා ද, රජුනට උපභෝග වූ යම් දෑ ද ආදිය වූ සියලු සම්පත් වහා ලබයි.

ගිහිගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සියලු කෙලෙසුන් නසා සම්මාසම්බුද්ධ වන අතර සියලු දෙව් මිනිසුන්ට ශාස්තෘ ද වන්නේ ය. එහිදී සම්මාසම්බුදුරජාණන් වහන්සේ නමකට අවශ්‍ය උපභෝග, පරිභෝග බුදුරජාණන් වහන්සේට නිසි වූ දෑ ඈද්ද සියල්ල ම ඉතාම සුවසේ ලබයි.

රන්පැහැ රුව ලෙස අඹනා ලද වූ
ජඞ්ගා යුග්මය මුනිඳුට බිහි වූ
ඒණි මුවෙකුගේ කෙණ්ඩය මෙන් වූ
වටව මසින් පිරිපුන් ලෙස දිස් වූ

ශිල්පය සපුරා හොඳින් උගත් වා
අන් අයගේ යහපත ම සලස් වා
නිසි උතුමන් හට සැලකුම් දක් වා
මුනිඳුගෙ දඟ යුග සවිමත් වූ වා

## 12. සියුම් සිවියක් ඇති ලක්‍ෂණය සහ එය පහළවීමට හේතු.

බුදුරජාණන් වහන්සේ පෙර මිනිස් භවයන්හිදී මහණකු හෝ බමුණකු කරා එළැඹ කුසල් කුමක්ද, අකුසල් කුමක්ද, කුමක් වැරදි ද, කුමක් නිවැරදි ද, කුමක් සෙවිය යුතු ද, කුමක් නො සෙවිය යුතු ද, කුමක් කිරීමෙන් බොහෝ කල් අහිත පිණිස පවතී ද, කුමක් කිරීමෙන් බොහෝ කල් සැප පිණිස පවතී ද යන වග විචාරීමෙන් ඒ ඒ කර්මයන් සිදුකළ බැවින් යළි යළි අප්‍රමාණව ඒ කර්මයන් සම්පූර්ණ කළ බැවින් මරණයෙන් මතු සෝභන වූ දිව්‍ය ලෝකයේ පහළ වී එහි අප්‍රමාණ සැප සම්පත් විඳ එයින් චුත ව මිනිස් ලෝකයෙහි ඉපිද මේ මහා

පුරුෂ ලක්ෂණයෙන් සමන්විත විය. ගිහිගෙයි වසන්නේ නම් සක්විති රාජ්‍ය ලබන අතර එහිදී මහා ප්‍රභූවන්ත වෙයි. කාමභෝගීන් අතර ප්‍රඥාවෙන් එම සක්විති රජුට සමාන හෝ ප්‍රඥාවෙන් වැඩි කෙනෙක් නොමැත.

ගිහිගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සියලු දෙව් මිනිසුන්ට අග්‍ර වූ සියලු කෙලෙසුන් නසා උතුම් සම්මාසම්බුද්ධත්වයට පත් වේ. එහිදී මහා ප්‍රඥා ඇති වෙයි.

ස්කන්ධාදී ධර්මයන් වහාම වටහා ගැනීම සඳහා නුවණ පහළ වේ. සතුට බහුලව මාර්ගඵල ආදිය සකස් කරන නුවණ පහළ වේ. තියුණු නුවණක් පහළ වේ. විනිවිද යන නුවණක් පැතිර පවතින අතර සියලු සතුන් අතුරෙහි සම්මාසම්බුදුරජාණන් වහන්සේට වඩා නුවණින්, ප්‍රඥාවෙන් අගතැන්පත් වූ කිසිවෙක් නොවෙයි.

තඹුරු පතක නැත ජලය රඳන්නේ
බුදු සිරුරෙහි දූවිලි නො රඳන්නේ
පිරිසිදු කය මුනිඳුට හිමිවන්නේ
සිසිලස පිණිසයි ගත දෝවන්නේ

පොකුණු ලිං තනවා
සැම දනන් සිත් පිනවා
පිනෙන් මුනිඳුට හගවා
දූලි නො රඳන කයක් වූවා

**13. රන්වන් පැහැ සිවිය ඇති ලක්ෂණය සහ එය ඇතිවීමට හේතු.**

බුදුරජාණන් වහන්සේ පෙර මිනිස් භවයන්හී ඉපිද කෙන්ති නො ගැනීමෙන් ද, උපායාස නො කොට අන් අය සමඟ ක්‍රෝධයෙන් නො ගැටී, තරහා ආදියට නො පැමිණ ක්‍රෝධ ආදී අරමුණු සිතේ නො පැවැත්වීමෙන් ද, ක්‍රෝධයත්, ද්වේෂයත්, නො සතුටත් නො පහළ කළේ ය.

සියුම් වූ මොලොක් වූ ඇතිරිලි ද, පොරෝනා ද, සියුම් කොමු, සියුම් පලස් දන් දුන්නේ ය. මෙබඳු කර්මයන් යළි යළි අප්‍රමාණ ව සිදුකළ බැවින් මරණයෙන් මතු දිව්‍ය ලෝකයෙහි ඉපිද අපමණ දිව්‍ය සම්පත් විඳ එයින් චුත ව මිනිස් ලෝකයට පැමිණ මේ මහා පුරුෂ ලක්ෂණයෙන් පරිපූර්ණ වී ගිහිගෙයි වසන්නේ නම් සක්විති රජ බවට පත් වී සියුම් මොලොක් වූ ඇතිරිලි ද ආදී සියලු සැප සම්පත් ද, දුටුවන්ට ප්‍රිය උපදවන ඉතාම මනරම් සියුම් ශරීර පැහැයකින් වාසය කරයි.

ගිහිගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සියලු කෙලෙසුන් නසා සම්මාසම්බුද්ධත්වයට පත් වී සියුම් මොලොක් ඇතිරිලි ද, පොරොනා, පලස් ආදි සියලු සැප සම්පතින් පරිපූර්ණ වන අතර දුටුවන්ට ප්‍රිය උපදවන ඉතාම සෝභමාන ශරීර වර්ණයක් ද ලැබේ.

පිරිසිදු කයම අප ලෝනා මුනිඳුන් ගේ
රන් පැහැයෙන් දිලෙයි තැනූ පිළිමයක් වගේ
විහිදෙන සිනිඳු සිරුරෙන් රැස් දහර අගේ
පෙන්වයි උතුම් බව තිලොවට මුනිඳුන් ගේ

දිවියෙහි පෙර දා හිමියන් බෝසත්
ක්‍රෝධ වෛර සිත් දුරු කළ පා මෙත්
සියුම් වස්ත්‍ර දෑ දන්දීමෙන් ලත්
කුසලට බුදු සිරුර ම රන් පැහැ ගත්

**14. කොසෝහිත වස්තු ගුහ්‍යක ලක්ෂණය සහ එය ඇතිවීමට හේතු.**

බුදුරජාණන් වහන්සේ පෙර මිනිස් භවයන්හි ඉපිද විවිධ මිනිසුන් අතර බොහෝ කල් දක්නට නැති වී ගිය නෑයන්, මිතුරන්, හිතවත් අය යහළුවන් ආදිය සමගි කළහ. ඔවුනොවුන්ව මුණ ගැස්සූහ. මව පුතු සමඟ ද, පුතු මව සමඟ ද, පියා පුතු සමඟ ද, පුතා පියා සමඟ ද, මව පියා සමඟ ද, සොහොයුරා සොහොයුරිය සමඟ

ද, සොහොයුරිය සොහොයුරා සමඟ ද ආදී වශයෙන් ඔවුනොවුන් සමගි කළ බැවින් මෙබඳු කර්ම අප්‍රමාණ කළ බැවින් මරණයෙන් මතු සෝභන ගති ඇති දිව්‍ය ලෝකයෙහි ඉපිද අපමණ දිව්‍ය සම්පත් විඳ එයින් චුත ව මිනිස් ලෝකයට පැමිණ මේ මහා පුරුෂ ලක්ෂණය ලැබීය.

ගිහිව වාසය කරන්නේ නම් සියලු සැප සම්පතින් පිරි සක්විති රාජ්‍ය ලබන අතර එහිදී බොහෝ ප්‍රභූන් ඇත්තේ වෙයි. ශූර වූ, මූර්තිමත් වීර්යය ඇති සතුරන් මැඩිය හැකි දහසකට වැඩි තරම් පුත්‍රයෝ ලබන්නේ ය.

ගිහිගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සියලු කෙලෙසුන් නසා උතුම් වූ සම්මාසම්බුද්ධත්වයට පත් වන්නේ ය. එහි ශූර වූ උතුම් වූ මහා ප්‍රඥාවන්ත තෙද ඇති ශ්‍රාවක පුත්‍රයෝ දස දහස් ගණන් ලබන්නේ ය.

නොපිපුණු පියුමක කෙමියක් විල සේ
කොපුවක සැඟවී ඇති ලෙස රහ සේ
දක්වයි පැවතුම රහසඟ මෙලෙ සේ
උත්තම මුණි කම්සැප දුරු කළ සේ

අසමගි වූවන් සමගි කිරී මෙන්
බඹසර රැකි පින හිමිට ලැබී මෙන්
දිස්විය රහසඟ ඇත් රජෙකුගෙ මෙන්
රන් කොපුවක සැඟවී නොපෙනී මෙන්

**15-16. නුග රුකක් සේ සම පමණ ඇති සහා සිටගත් විට නො නැමී අත් දෙකෙන් දෙදන පිරිමැදිය හැකි ලක්ෂණ සහ ඒවා ඇතිවීමට හේතු.**

බුදුරජාණන් වහන්සේ පෙර මිනිස් භවයන්හිදී, මහජනයාහට පුද්ගල භේදයකින් තොරව සුදුස්සාට සුදුසු තැන දෙමින් කටයුතු කළ බැවින්, ඒ ඒ කර්මයන් අප්‍රමාණව සකසා කළ බැවින් මරණින් මතු දිව්‍ය ලෝකයෙහි ඉපිද, එහි අප්‍රමාණ සැප සම්පත් විඳ එයින් චුත ව මිනිස් භවයක් ලැබ මේ මහා පුරුෂ ලක්ෂණ පහළ විය.

ගිහිගෙයි වසන්නේ නම් දස ධර්මයන්ගෙන් රාජ්‍ය කරන සක්විති රජෙක් බවට පත් වන අතර ආඪ්‍ය, මහත් ධන ඇති, මහත් භෝග ඇති, බොහෝ රන් රිදී, වස්තු උපකරණ ධන ධාන්‍ය යන සියලු සම්පතින් පරිපූර්ණ වේ.

ගිහිගෙයින් නික්ම පැවිදි වුවහොත් සියලු කෙලෙසුන් නසා සම්මාසම්බුද්ධත්වයට පත්වෙන අතර, ආඪ්‍ය මහත් ධන ඇති මහත් භෝග ඇති, ශ්‍රද්ධා ධනය ශීල ධනය, හිරි ධනය, ඔත්තප්ප ධනය, ශ්‍රැත ධනය, ත්‍යාග ධනය, ප්‍රඥා ධනය යන මේ සියලු ධනයෝ වෙසෙසින් ලබන සුළු වේ.

උසට සරිලන මහත කඳක් ඇති
අතු විහිදා වැජඹෙන්නේ 'වනස් පති'
නුගරුක සේ පිරිපුන් සිරුරක් ඇති
උසවෙයි බඹයක් තිලොවට අධි පති

පව් නොකර ගොසින් වත්
නොකළෙන් මුලා සව් සත්
උස මහත සවි මත්
කියති මුනිඳුට පින් වත්

හිටගෙන වැඩ සිටින විට ලොව්තුරු මුනිඳු
දෙදණ වෙතට දික්වෙයි හිමි දෑත් මුදු
පිරිමැද දෙදණ නොනමා තම සිරුර බුදු
හස්තය උතුම් පෙන්වයි හිමි ලෝක විදූ

**17-18-19. උස් වූ ගොප් ඇට ඇති පා සහ උඩුකුරුව යොමුවූ ලොම් ඇති ලක්ෂණ සහ ඒවා ඇතිවීමට හේතු.**

බුදුරජාණන් වහන්සේ පෙර මිනිස් භවයන්හිදී සද්ධාවෙන්, ශීලයෙන් වැඩෙන අයුරින්, පිරිසිදු වචන ඇති ත්‍යාගයෙන් වැඩෙන අයුරින්, ලෞකික ධර්මයන්ගෙන් වැඩෙන අයුරින්, ප්‍රඥාවෙන් වැඩෙන අයුරින්, ධන ධාන්‍යයෙන්, කෙත් වතුවලින් වැඩෙන

අයුරින් දෙපා, සිව්පා සතුන්ගේත්, අඹුදරුවන්ගේත් දැසි දස් මිතුරන්ගේත්, පරම්පරාගත නෑදෑයන් ආදී බෙහෝ දෙනාගේත් ඔවුනොවුන්ගේ දියුණුවට කටයුතු කළහ. උපකාර කළහ. ඒ කර්මයන් බොහෝ සිදුකළ බැවින් මරණයෙන් මතු දිව්‍ය ලෝකයෙහි ඉපිද එහි සියලු සැප සම්පත් විඳ එයින් චුත ව මිනිස් ලෝකයට පැමිණ මේ මහා පුරුෂ ලක්‍ෂණ පහළ වූහ.

ගිහිගෙයි වසන්නේ නම් සියලු සම්පතින් පිරි සක්විති රජ බවට පත් වී නො පිරිහෙන ස්වභාවය ඇත්තේ වෙයි. ධන ධාන්‍යයෙන්, කෙත් වතුවලින්, දෙපා-සිව්පාවන්ගෙන් අඹුදරුවන්ගෙන්, දැසි දස් කම්කරු පුරුෂයන්ගෙන්, නෑදෑයින්ගෙන්, මිතුරන්ගෙන් නො පිරිහෙයි. සියලු සම්පත් ලබයි.

ගිහිගෙයින් නික්මී පැවිදි වන්නේ නම් සියලු කෙලෙසුන් නසා සම්මාසම්බුද්ධත්වයට පත්වෙන අතර පිරිස් බලයෙන් නො පිරිහෙයි. සද්ධාවෙන්, සීලයෙන්, ශ්‍රැතයෙන්, ත්‍යාගයෙන්, ප්‍රඥාවෙන් යන ගුණයන්ගෙන් නො පිරිහෙයි. සියලු සැපතින් නො පිරිහෙයි.

කේසර සිංහ රජෙකුගෙ සිරුරෙහි සැදුණු
ඉදිරි කොටස මෙන් තෙදවත් බව පිරුණු
තිලොවග මුනිඳු හට පෙර පිනකින් ලැබුණු
නිසිලෙස වැඩුණු අවයව ඇති ගත දිලුණු

අකටයුතු පලවා
ඍජු ලෙසට වැඩ කරවා
ලද පිනෙන් භගවා
මුනිඳු තේජස පෑවා

පිටු පස වසාගෙන ඉහළට විහිද යන
රන් පුටරුවක් ලෙස සමිඳුගෙ ගත රඳන
මස් පිඬුවක් නිසා පිට මැද බෙදී නො යන
අනගි පුරිස් ලකුණකි මුනි කය දිලෙන

යහ මඟ කරුණාවෙන් පෙන්වා
දානය දී දුක් ගිනි ද නිවා
ඵල ලැබ සතහට කළ සේවා
නො බෙදුනු පිට සමිඳුට වූවා

සම්බුදු හිමි ගෙල වටකුරු වන්නේ
රන් කළසක කරමෙන් දිදු ලන්නේ
ගැඹුරු මිහිරි හඬ හිමිට ලැබෙන්නේ
දෙසුමයි දහමේ ලොව සන සන්නේ

මානය තොරවිය බෝසත් දිවියේ
පිවිතුරු යහපත පැතිර ගියේ
පිදුව පිනෙන් උතුමන් සරියේ
රන්පැහැ මුනි ගෙල වටකුරු වූයේ

**20. දිවෙහි උඩු කුරුව කෙළින් නැගී සමව රසය ඵළවන රස නහරයෝ ඇති ලක්ෂණය හා එය ඇතිවීමට හේතු.**

බුදුරජාණන් වහන්සේ පෙර මිනිස් භවයන්හිදී අත්වලින් හෝ දඬුමුගුරුවලින් හෝ අවිවලින් ආදියෙන් කිසිම සතකුට හිංසා නො කළහ. ඒ ඒ කර්මයන් අප්‍රමාණව සිදුකළ බැවින් මරණයෙන් මතු දිව්‍ය ලෝකයෙහි ඉපිද එහි සෝභන වූ සැප සම්පත් විඳ, එයින් චුත ව මිනිස් භවයෙහි ඉපිද මේ මහා පුරුෂ ලක්ෂණය ලැබීය.

ගිහිගෙයි වසන්නේ නම් සියලු සැප සම්පතින් හෙබි සක්විති රජ වී, ඉතා සීත ද නොවූ, ඉතා උෂ්ණ ද නොවූ, සමව ඇති වූ කර්මයෙන් තේජෝ ධාතුවෙන් සමන් විත වේ. නිරෝගි ද, නිදුක් ද වෙයි. ගිහිගෙයින් නික්මී පැවිදි වන්නේ නම් සියලු දෙව් මිනිසන් අතර සම්මාසම්බුද්ධත්වයට පත් වේ. එහිදී ඉතා ශීත ද නොවූ ඉතා උෂ්ණ ද නොවූ මධ්‍යම වූ වීර්ය වැඩීමට පහසු වූ කර්මයෝ හටගත් තේජෝ ධාතුවෙන් සමන් විත වේ. නිරෝගි වේ. නිදුක් බව ඇති වේ. ඉතාම තේජස් ස්වරූපයෙන් වැඩ සිටියි.

උඩට හැරී රස නහර සත් සියක්
ඇත කෙළවර උගුරෙහි එක් වීමක්
දිව'ග තැබූ පමණින් මුනි අහරක්
සිරුර පුරා පැතිරෙයි රස දහරක්

කිසිවෙකු හට නැත වස විස කැව්වේ
රසැති අහර උතුමන් හට පිදුවේ
සම්බුදු හිමි ගේ පින් බල හමුවේ
සත්සියයක් රස නහර ම ලැබුවේ

## 21-22. වෙසෙසින් නිල්වන් වූ ඇස් ඇති එකෙනෙහි උපන් රතු වස්සෙකුගේ ඇස් පියුම් ඇති ලක්ෂණ සහ ඒවා ඇතිවීමට හේතු.

බුදුරජාණන් වහන්සේ පෙර මිනිස් ආත්මයන්හිදී කෝපයෙන් ඇස් ඔරවා නො බැලීය. ක්‍රෝධයෙන් හිස ඇලකොට ඇස් කොනකින් නො බැලීය, ක්‍රෝධයෙන් නො බැලුවේ ය. කෙළින් ම ඇස් පුරා පැහැදිලි සිතින් යුක්තව සියලු දෙනාවෙත බැලුවේ ය. එබඳු කර්මයන් යළි යළි අප්‍රමාණව සිදුකළ බැවින් මරණයෙන් මත්තෙහි දිව්‍ය ලෝකයන් හි ඉපිද එහි අපමණ සැප සම්පත් විඳ එයින් චුත ව මිනිස් ආත්මයෙහි ඉපිද මේ මහා පුරුෂ ලක්ෂණ ලැබූහ.

ගිහිගෙයි වසන්නේ නම් සියලු සැපසම්පතින් පරිපූර්ණ වූ සක්විති රජ වන්නේ ය. එහි දී සැම දෙනාට ම ප්‍රිය වූ දැකුම් ඇත්තේ වෙයි. බමුණන්ට, ගැහැවියන්ට, නියම්ගම් වැසියන්ට, දනව්වැසියන්ට, ගණන් කරන්නන්ට, ඇමති මහාමාත්‍යාදීන්ට සේනා ආරක්‍ෂා කරන්නන්ට, දොරටු පාලකයන්ට, පරම්පරාගත රාජ පාක්ෂිකයන්ට, සියලු රජුනට, රජුගේ සියලු භෝග සම්පත් පරිහරණය කරන්නවුන්ට කුමරුවරුන්ට බොහෝ දෙනාට ප්‍රියමනාප වෙයි.

ගිහිගෙයින් නික්ම පැවිදි වන්නේ නම් උතුම් වූ සම්මාසම්බුද්ධත්වයට පත් වන්නේ ය. එහිදී සියලු සැප සම්පතින් ආඪ්‍ය වූ සියලු පිරිවර ජනයාගෙන් සමන්විත වූ භික්ෂූන් වහන්සේලාට, භික්ෂුණීන් වහන්සේලාට, උපාසක උපාසිකාවන්ට, සියලු දෙවියන්ට, මිනිසුන්ට, අසුරයන්ට, නාගයන්ට, ගන්ධබ්බයන්ට ඉතාම ප්‍රිය මනාප වේ.

සුදු කළු රන් පැහැ වටව පෙනෙන්නේ
මැද නිල් මහනෙල් පෙත්තක් වැන්නේ
පිවිතුරු නෙත් සමිඳුගෙ දිදු ලන්නේ
මෙත් කරුණා සෝ දහර ගලන්නේ

බුදුහිමි පෙර නැත රවලා බැලුවේ
ඇවැසි බෙහෙත් ඇස් පෙනුමට පිදුවේ
නැත අඳ අයහට අවමන් කෙරුවේ
පිනටය මුනි නෙත් නිල්වන් වූවේ

එදින උපන් රතු වස්සගෙ ඇස් ගුලි
ලෙසට සමානය මුනි නෙත් පැහැ දිලි
පිරිසිදු මැණිකක් වාගේ දිලි දිලි
සමිඳුගෙ නෙත් දුනි සතහට සැන සිලි

කෝපයෙන් හෝ රැවී මෙන්
දනන් දෙස නොබැලී මෙන්
මුනි ලැබූ කුසල් මහි මෙන්
නෙත් සැදී 'ගෝපඛුම' මෙන්

### 23. පිරුණු නළල සහිත හිස ඇති ලක්ෂණය සහ එය ඇතිවීමට හේතු.

බුදුරජාණන් වහන්සේ පෙර මිනිස් භවයන්හිදී බොහෝ දෙනා කුසල් දහම් හී යොමු කළහ. කාය සුචරිතයෙහි ද, වාග් සුචරිතයෙහි ද, මනෝ සුචරිතයෙහි ද, දන් දීමෙහි ද, සිල් සමාදන් වීමෙන් ද, පෙහෙවස් සමාදන් වීමෙන් ද, මවට උපස්ථානය කිරීමෙන් ද, පියාට

උපස්ථාන කිරීමෙන් ද, මහණ බමුණන් පිදීමෙන් ද, කුල පරම්පරාවෝ පිදීමෙන් ද බොහෝ කුසල් කර්මයන් හිදී බොහෝ දෙනාට ප්‍රමුඛ විය. ඒ ඒ කර්මයන් සකසා සපුරා අප්‍රමාණව සිදුකළ බැවින් මරණයෙන් මතු දිව්‍ය ලෝකයෙහි ඉපිද එහි සියලු සැප සම්පත් විඳ, එයින් චුත ව මිනිස් ලෝකයෙහි පහළ වී මේ මහා පුරුෂ ලක්‍ෂණය ලැබීය.

ගිහිගෙයි වසන්නේ නම් සියලු සැපසම්පතින් පිරි සක්විති රජවන අතර, එහිදී මහජනයා ඔහු සමග යන්නේ වේ. බමුණු ගැමියෝ ද, නියම්ගම් දනව්වැසියෝ ද, ගණන් කරන්නෝ ද, මහා ඇමතියෝ ද, සේනාකර වන්නෝ ද, දොරටුපාලකයෝ ද, ඇමතියෝ ද, පරම්පරාගත රාජ පාක්‍ෂිකයෝ ද, රජුගේ දේපල භෝග පරිහරණය කරන්නෝ ද, රජකුමරුවෝ ද යන සියලු දෙනා ම රජු අනුව යන්නෝ වෙති.

ගිහි ගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සියලු කෙලෙසුන් නසා සම්මාසම්බුද්ධත්වයට පත් වන්නේ ය. එහිදී භික්‍ෂු-භික්‍ෂුණී, උපාසක-උපාසිකා, දෙවි-මිනිස්, අසුර-නාග, ගන්ධර්ව යන සියලු දෙනා බුදුරජාණන් වහන්සේ අනුව යන්නේ ය.

සිළුව දෙකන තෙක් පුළුල්ව විහි දෙන
මස් පටලය වෙයි නළල වැසී යන
මුණිඳුගෙ පිරිපුන් නළලෙහි ලස්සන
රජෙකුගෙ රන්වන් නළල් පටිය මෙන

සිත කය දෙකෙන් පිරිසිදු වූයේ
දන් දී සිල් රැක උතුමන් පිදුයේ
ලද පිනටයි මුනි පෙර අත් බවයේ
සිරස ද නළල ද පිරිපුන් වූයේ

**24-25. එක් එක් රෝම කූපයෙහි එක් එක් රෝම කූපයක් ඇති බව සහ, දෙබැම අතුරෙහි සුදු පැහැති මොලොක් පුළුන් රොදක් බඳු වූ ඌර්ණරෝම ධාතුව යන ලක්ෂණ සහ ඒවා පහළවීමට හේතු.**

බුදුරජාණන් වහන්සේ පෙර මිනිස් භවයන්හිදී බොරුකීමෙන් වැළකී, ඇත්ත ඇති සැටියෙන්ම ප්‍රකාශ කොට ලෝකය නො රවටන වචන කථා කළ අතර සෑම විටම සත්‍ය වචනය ප්‍රකාශ කොට ඒ ඒ ආකාරයෙන් මෙම කර්මයන් අප්‍රමාණව සිදුකළ බැවින් මරණයෙන් මතු සෝභන වූ, දිව්‍ය ලෝකයෙහි ඉපිද එහි අප්‍රමාණ සැප සම්පත් විඳ එයින් චුත ව මිනිස් ලොව ඉපිද මේ මහා පුරුෂ ලක්ෂණ ලැබූහ.

ගිහිගෙයි වසන්නේ නම් සක්විති රජවන අතර, එහිදී සියලු පිරිවර ජනයා ඒ සක්විති රජු අනුගමනය කරන්නේ ය.

ගිහිගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සියලු කෙලෙසුන් නසා උතුම් වූ සම්මාසම්බුද්ධත්වයට පත්වෙන අතර භික්ෂු-භික්ෂුණී, උපාසක-උපාසිකා, දෙව්-මිනිස්, අසුර-නාග, ගාන්ධර්ව යන සියලු දෙනා බුදුරජාණන් වහන්සේ අනුව ගමන් කරන්නේ, අවවාදය පිළිපදින්නේ ය.

සියලු සතට මෙත් පතුරා සසරේ
රන් පැහැගත් බුදු සමිඳුගෙ සිරුරේ
රෝම කූප වෙන් වෙන් ලෙස පැතිරේ
හැමදේ තොල් අග බුදුසිරි මැතිරේ

පෙර දා ඇත්ත කීමෙහි
පිනෙන් ලද බුදු සිරු රෙහි
එක් එක් ලෝම අත රෙහි
සමක් රන්වන් දිලු නෙහි

නළලෙහි දෙබැම මැද දකුණට කර කැවුණු
රියන් දිගැති රෝමය සුදු පැහැ ගැණුනු
රිදී බුබුලක් ලෙසට රන් පෝරුවෙ දිලුණු
ඌර්ණ රෝමයයි සමිඳුට උරුම වුණු

බුදු හිමි පෙර බවේ
මුසා බස් නැත දෙඩුවේ
ලලාට රෝමය ලැබුවේ
සත්‍යයේ බලයෙන් වේ

**26-27. පරිපූර්ණ වූ දත් හතළිහ සහ විරල නොවූ දත් ඇත්තේය යන ලක්ෂණ සහ ඒවා ඇතිවීමට හේතු.**

බුදුරජාණන් වහන්සේ පෙර මිනිස් භවයන්හිදී කේලම් නො කියමින් එකිනෙකා කොටවන අදහස් නො කියමින්, අසමගියෙන් සිටි පිරිස් සමගි කරමින්, සමගියෙන් සිටි පිරිස් අසමගි නො වන සේ කටයුතු කරමින්, ඒ ඒ කර්මයන් බොහෝ කළ බැවින් පුන පුනා කළ බැවින් මරණයෙන් මතු දිව්‍ය ලෝකයෙහි ඉපිද එයින් චුත ව මිනිස් ලොව ඉපිද මේ මහා පුරුෂ ලක්ෂණ ලැබූහ.

ගිහිගෙයි වසන්නේ නම් සක්විති රජ වන අතර එහිදී භය නැති පිරිස් ඇති වෙයි. බ්‍රහ්මණ, ගෘහපති, ගම්නියම්ගම්වාසී, රාජකුමාර ආදී මේ සියලු පිරිස් අසමගි කළ නො හැකි වේ.

ගිහිගෙයින් නික්ම පැවිදි වන්නේ නම් සියලු කෙලෙසුන් නසා සම්මාසම්බුද්ධත්වයට පත් වන්නේ ය. එහිදී භික්ෂු-භික්ෂුණී, උපාසක-උපාසිකා, දෙව්-මිනිස්, අසුර-නාග, ගන්ධර්ව යන පිරිසේ ඇති සමගිය බිඳිය හැකි නොවේ.

සම සතළිස් දත්වෙයි සමිඳුගෙ මුවෙහී
සුදු පැහැ දන්ත මුතු ඇට විලසින් දිලිහී
නොමැතිව සිදුරු එකිනෙක බැඳි දත් පෙළෙහී
සැකසුම නිසයි පැහැදිලි බව මුනි හඬෙහි

නොසඟවා ගුණ වැයුමත්
ඇත්ත පමණක් කීමත්
සමගි බව නොබිඳී මත්
නිසයි සමිඳුට හතළිහක් දත්

සම්බුදු සමිඳු වැළඳීමෙන් පසු අහර
නැත කිසිවක් රඳව්වේ සමදත් අතර
සිදුරු නොමැතිව දත් පෙළ ඇති මුනි පවර
ලකුණ පුරිස් හිමිවෙයි 'දන්ත අවිරළ'

නොකළෙන් අකට යුතු
අමුණා සමගියේ මුතු
පිහිටෙන් කුසල් මුනි සතු
ලැබුණි 'අවිරළදන්ත' මුතු

**28-29. දික් පුලුල් වූ දිව ද, බඹහුගේ බඳු ගැඹුරු හඬ සහ කුරවි කොවුලකුගේ බඳු මිහිරි ලක්‍ෂණ සහ ඒවා ඇතිවීමට හේතු.**

බුදුරජාණන් වහන්සේ පෙර මිනිස් භවයන්හිදී ආක්‍රෝශ නො කළහ. හිංසාවෙන් සිත පෙළන මහජනයාගේ සිත් රිදවන බසින් වැලකුණහ. කනට සැප වූ සිත සන්සුන්වන ඉතාම යහපත් බොහෝ දෙනාට සැප පිණිස වූ යම් වචන වේද ඒ සියල්ල එසේම භාවිතා කළ බැවින් අප්‍රමාණව සිදුකළ බැවින් මරණයෙන් මතු දිව්‍ය ලෝකයෙහි ඉපිද එයින් චුත ව මිනිස් ලොව ඉපිද මේ මහා පුරුෂ ලක්‍ෂණ ලැබූහ.

ගිහිගෙයි වසන්නේ නම් සක්විති රජවන අතර එහි දී පිළිගත යුතු වචන ඇත්තේ වෙයි. බමුණෝ ද, ගැහැණියෝ ද, නිගම්වැසි, දනව්වැසි ආදී සියලු පිරිස් සක්විති රජතුමාගේ බස ඉතාම මැනවින් පිළිගන්නේ වේ.

ගිහිගෙයින් නික්මී පැවිදි වන්නේ නම් සියලු කෙලෙසුන් නසා සම්මාසම්බුද්ධවයට පත්වෙන අතර එහි සිව්වනක් පිරිස ඇතුළු සියලු පිරිස් විසින් බුදුරජාණන් වහන්සේගේ වචනය ඉතාම මැනවින් පිළිගන්නේ ද වේ.

මුදු මොළොක් වෙයි දිගු පුළුල් දිව
රත් නෙළුම් පෙත්තක් ලෙසේ
පිරිමැදිය හැක තම දෙකන් පෙති
දිගු කළොත් මුනි දිව ලෙසේ
පළල දිව හිමි විය මුනිඳුට
නළල් තලයම වැසෙන සේ
කුරවි කොවුලන් නාද පරදන
දහම් හඬ තිලොවට ඇසේ

අවහිර නොකළ අන් අය දෙඩුමට
ලෝසත සැනසූ යහපත් වදනට
පැහැදිලි ලෙස දම් දෙසුවෙන සැමහට
දිගු පුළුලින් යුත් දිව ඇත සමිඳුට

බ්‍රහ්මස්වරයෙන් දහම් දෙන සඳ
වියැළෙන්නේ නැත උගුර කට
ශබ්ද අර්ථ පිරි වදන් වැලක් නිති
ගලා හැලෙයි මුනිඳුගෙ මුවට
මිහිරි හඬින් පැහැදිලිව දෙසන දම්
කිමිදෙයි හැම හදවත් තුලට
මෙයද පුරිස ලකුණක් වෙයි හිමිවූ
භගවත් සම්බුදු හිමි යන්නට

නොකියන් පරොස් බස්
තෙපලට මුදු මිහිරි බස්
පිනට පෙර මහ පුරිස්
ලකුණ ලැබුවේ මුනි උසස්

## 30. සිංහයෙකුගේ යටි හනුව සේ පිරුණු උඩි යටි දෙහනුව ඇති ලක්‍ෂණය සහ එය ඇතිවීමට හේතු.

බුදුරජාණන් වහන්සේ පෙර මිනිස් භවයන්හිදී ඉපිද හිස් වචන කථා නො කොට සත්‍ය ම ප්‍රකාශ කොට අන් අයට යහපතක් වෙන ආකාරයට ම කථා කොට යහපත වෙනුවෙන් සිතේ තබාගත හැකි දෙයක් ම කථා කොට කරුණු සහිතව සැමදෙනාගේ ම යහපත වෙනුවෙන් ඉතාම අර්ථවත් කතාවක් සිදු කොට ඒ කර්මයන් අප්‍රමාණව සිදුකළ බැවින් මරණින් මතු දිව්‍ය ලෝකයෙහි ඉපිද එයින් චුත ව මිනිස් ලෝකයේ ඉපිද මේ මහා පුරුෂ ලක්‍ෂණය ලැබීය.

ගිහිගෙයි වසන්නේ නම් දස කුසලයෙන් රට පාලනය කරන සක්විති රජ වන්නේ ය. සක්විති රජ වන්නේ කිසිදු සතුරකුට මැඬලිය හැකි නොවේ. අවශ්‍ය සියලු සම්පත් පහළ වේ. දැහැමින් රට පාලනය කරනු ලැබේ.

ගිහිගෙයින් නික්මී පැවිදි වන්නේ නම් සියලු කෙලෙසුන් නසා සම්මාසම්බුද්ධත්වයට පත් වන්නේ ය. එහිදී අන්සත්වයන්ට උපදින පරිදි රාගය විසින් හෝ ද්වේෂය විසින් හෝ මෝහය විසින් හෝ ආනන්තරික සතුරන් කිසිදු කෙනෙකුට නො රැදිය නො හැකි වන්නේ ය.

සිහරජෙකුගෙ යටි හක්ක සමානා
හනු ඇත පිරිපුන් මුනිඳුට ලෝනා
උඩු-යටි හනු එකිනෙකට ගැටෙන්නා
පුන් සඳ විලසට වත බැබලෙන්නා

පාරමිතා පිරූ හිමි අප බෝසත්
පව් නොකළේ වදනින් කිසි දිනකත්
පිය තෙපුලෙන් සැමදෙන ඇමතීමත්
මුල්විය ලැබුමට සිහහනු ලකුණත්

## 31-32. ඉතා සුදු පැහැති දත් සහ එම දත් සමව පිහිටි යන ලක්‍ෂණයන් හා ඒවා ඇතිවීමට හේතු.

බුදුරජාණන් වහන්සේ පෙර මිනිස් භවයන්හිදී මිථ්‍යා ආජීවය හැර කර්මාන්ත ආදියෙන් කරන වංචා, මිනීමෙන් කරන වංචා, අල්ලස් ගෙන කරන වංචා, නොයෙක් උපායෙන් අනුන් රැවටීම, සැබෑ නොවූ රන්-මැණික් ආදිය දීමෙන් කරන වංචා, ඔවුනොවුන් කෙටවීම, සැඟවී සිට අන්සතු දේ පැහැර ගැනීම, ගම් පැහැරවීම, නුවරවල් පැහැරවීම ආදිය බලහත්කාරයෙන් ගැනීම ආදී අනුන්ට අසහනය පිණිස වන ක්‍රියා වලින් සම්පූර්ණයෙන්ම ඉවත් වී ඒ ඒ කර්මයන් බොහෝ අප්‍රමාණව කළ බැවින් මරණින් මතු දිව්‍ය ලෝකයෙහි ඉපිද එහි අපමණ දිව්‍ය සම්පත් විඳිමින් අන්දෙවියන්ට වඩා දිව්‍ය ආයුෂයෙන් ද, දිව්‍ය වර්ණයෙන් ද, දිව්‍ය සැපයෙන් ද, දිව්‍ය යසසින් ද, දිව්‍ය ආධිපත්‍යයෙන් ද, දිව්‍ය රූපයෙන් ද, දිව්‍ය ශබ්දයෙන් ද, දිව්‍ය ගන්ධයන්ගෙන් ද යන මේ කරුණු දහයෙන් අන් දෙවියන්ට වඩා විශේෂ වේ.

එයින් චුත ව මේ මිනිස් ලෝකයෙහි පහළ වී මේ මහා පුරුෂ ලක්‍ෂණ ලැබූහ.

ගිහිගෙයි වසන්නේ නම් දැහැමි වූ සිවුසයුර ඉම් කොට ඇති සිවු මහා දිවයිනට ම රජු වන්නේ ය. සතුරන් දිනූ දිවයින තහවුරු බවට පැමිණි සත් රුවනින් සමන්විත වෙයි. සියලු සැප සම්පත් සහ සියලු පිරිවර ජනයා ලබන්නේ ය.

උස් මිටි නොමැති දත් හතළිහ සම බැවිනි
රන් පැහැ මුවෙහි දිදුලන මුතු පෙළක් වැනී
රශ්මිය විහිදෙනා සුදු දත් ඇතිව මුනී
සිරි සදහම් දෙසුවෙ තිලොවම සනස මිනී

නිවැරදි දිවි පෙවෙත
ගතකොට පතුරමින් මෙත
සැපය දුන් සත වෙත
ලැබුනි සමදත් මුනි වෙත

සමිඳුගෙ වතෙහි නැගෙනා විට හස රැල්ල
සතර දන්ත දක්වා විහිදෙයි දෙතොල
දාඨා රශ්මියෙන් බැබලෙන මුව කමල
රඳවයි විමතියක් සැමගේ දෙනෙත තුල

වදනකින් වන වැරදී
පෙර නො කළ මුනි තාදී
කිරණ සුදු පැහැ විහිදී
සතර දළදාවන් ලදී

පින්වතුනි, මේ ආකාරයට විමසා බලන විට අපට පැහැදිලි වෙන්නේ බුදුරජාණන් වහන්සේ සම්මාසම්බුද්ධත්වය සඳහා කෙතරම් උසස් ප්‍රතිපදාවක නිරතව තිබෙනවද කියලා.

මේවා අප ඉතාම පැහැදිලිව තේරුම් ගත යුතු වෙනවා. අද නම් ආවාට ගියාට මේ සම්මාසම්බුද්ධත්වය ප්‍රාර්ථනා කරනවා. ඒ උතුම් සම්මාසම්බුද්ධත්වය ප්‍රාර්ථනා කරලා ලබන්න බැරි බවත් මේ උතුම් කුසල් ප්‍රතිපදාව අනුගමනය කිරීමෙන් සම්මාසම්බුද්ධත්වයට පත්විය හැකි බවත් අප ඉතාම හොඳින් අවබෝධ කරගත යුතුයි.

එය අවබෝධ කොට, බුදුරජාණන් වහන්සේ නමක් පහළ වන්නේ මොනතරම් කලාතුරකින්ද යන්නත්, ඒ ඉතාම දුර්ලභ අවස්ථාව අපට මුණ ගැසී ඇති බවත් හොඳින් තේරුම් අරගෙන, මේ උතුම් මිනිස් දිවියේ ලද දුර්ලභ වූ ශ්‍රී සද්ධර්මය මනාව තේරුම් අරගෙන මිසදුටු නොවී සීල, සමාධි, ප්‍රඥා නැමති අරි අටහි මග වඩමින් ඉතාම ඉක්මනින් මේ භයානක සසරින් එතර වීම පිණිස කටයුතු සලසා ගනිත්වා ! යි මෙත් සිතින් ප්‍රාර්ථනා කරමි.

**සැමට තෙරුවන් සරණයි !**

# ලක්ඛණ සූත්‍රයේ එන දෙතිස් මහා පුරුෂ ලක්ෂණ

1. **සුපතිට්ඨිත පාද** - සුපිහිටි පාද ඇති බව.

2. **පාදතලෙසු චක්කානි**
යටි පතුල් දෙකෙහි නිම්වළලු සහිත නාභිසහිත හැම අයුරින්ම පිරිපුන් සක් (රෝද) ලකුණු ඇති බව.

3. **ආයතපන්හිතා** - දික් විලුඹ ඇති බව.

4. **දීඝඞ්ගුලිතා** - දික් ඇඟිලි ඇති බව.

5. **මුදුතාළුනහත්ථපාදතා**
මුදු මොළොක් අත්පා ඇති බව.

6. **ජාලහත්ථපාදතා**
දැල් කවුළුවකට බඳු අත්පා ඇති බව.

7. **උස්සඞ්ඛපාදතා**
පිරුණු ගොප්මසින් යුත් පා ඇති බව.

8. **එණිජඞ්ඝතා**
ඕළු, මුවන්ගේ මෙන් කෙන්ඩා ඇති බව.

9. **ආනොනමාන්තෝ උභොහි පාණිතලේහි ජණ්ණුකානි පරිමසති**
නොනැමී දෙඅත්ලෙන් දෙ දන ස්පර්ශ කළ හැකි බව.

10. **කොසොහිතවත්ථගුය්හතා**
කොපුවක ගිලුණු පුරුෂ ඉන්ද්‍රිය ඇති බව.

11. **සුවණ්ණවණ්ණතා කඤ්චනසන්නි**
රන්වන් පැහැ, කසුන් වන් පැහැ සම ඇති බව.

12. **සුඛුමච්ඡවිතා**
දූලි කුණු නො තැවරෙන සියුම් සමක් ඇති බව.

13. **ඒකේකලෝමතා**
එක් එක් රෝම කූපයන්හි තනි තනිව ලෝම ඇති බව.

14. **උද්ධග්ගලෝමතා**
උඩ අතට කැරකුණු ලෝම ඇති බව.

15. **බ්‍රහ්මුජ්ජුගත්තතා** - බඹහුගේ මෙන් ඍජු ශරීරයක් ඇති බව.

16. **සත්තුස්සදතා**

දෙ අත්ල, දෙ පිටිපතුල්, දෙ උරහිස්, කර යන සත් තැන උස්ව (සමව) පිහිටා ඇති බව.

17. **සීහපුබ්බද්ධකායතා**

සිංහයකුගේ පපුව මෙන් පිරුණු පපුවක් ඇති බව.

18. **චිතන්තරංසතා** - පිට දෙපැත්ත මැද පිරුණු ඇති බව.

19. **නිග්‍රෝධපරිමණ්ඩලතා**

සමවූ උස මහත ඇති ශරීරයක් ඇති බව.

20. **සමවත්තක්ඛන්ධතා** - සමවූ වටවූ ගෙල ඇති බව.

21. **රසග්ගසග්ගීතා**

සත්සියයක් රසනහර තුඩුදුන් ගෙල ඇති බව.

22. **සීහහනුතා** - සිංහයකුගේ බඳු හක්ක ඇති බව.

23. **චත්තාළීසදන්තතා** - සමසතළිස් දත් ඇති බව.

24. **සමදන්තතා**

එකිනෙකට උස් පහත් නොවූ සම දත් ඇති බව.

25. **අවිරළදන්තතා** - අතර විවර (සිදුරු) නැති දත් ඇති බව.

26. **සුසුක්කදාඨතා** - ඉතා සුදු දළ දත් ඇති බව.

27. **පහූතජිව්හතා** - පළල් දිවක් ඇති බව.

28. **බ්‍රහ්මස්සරතා** - පිරිසිදු විරාගී කටහඬ ඇති බව.

29. **අභිනීලනෙත්තතා** - ඉතා නිල්වන් නෙත් ඇති බව.

30. **ගෝපඛුමතා** - ප්‍රසන්න ඇස්මඬල ඇති බව.

31. **උණ්ණ ලක්ඛණතා**

දෙබැම අතර ඌර්ණ රෝමයක් ඇති බව.

32. **උණ්හීසසීසතා** - පිරුණු නළල සහිත හිස ඇති බව.

# පූජ්‍ය වැලිමඩ පසන්නමානස හිමියන්ගේ වෙනත් ධර්ම ග්‍රන්ථ

1. මරණය අබියස ඔබ. (ගිලාන සූත්‍රය ඇසුරිනි)
2. ඇයි මේ වෙනස. (චූල්ලකම්මවිභංග සූත්‍රය ඇසුරිනි)
3. සසර කතරේ අතරමං නොවීමට නම්. (ජටා සූත්‍රය ඇසුරිනි)
4. බියකරු ලොවින් අපිත් නිදහස් වෙමු. (නන්දක ප්‍රේතවස්තුව ඇසුරිනි)
5. පිවිතුරු සිතක් ඇතිකර ගනිමු. (වත්ථූපම සූත්‍රය ඇසුරිනි)
6. කම් සුව අතහැර නිවන් සුවයට. (සුනක්ඛත්ත සූත්‍රය ඇසුරිනි)
7. අසිරිමත් ආර්ය උපෝසථය. (විසාඛ සූත්‍රය ඇසුරිනි)
8. දුක අවබෝධයෙන් දකින්නට නම්. (අචේලකස්සප සූත්‍රය ඇසුරිනි)
9. සුන්දර වූ නිවන් මග. (පටිපදා සූත්‍රය ඇසුරිනි)
10. අසරණ භාවයෙන් නිදහස් වෙමු.
11. ජීවිතයේ අවුල ලිහා ගනිමු. (විභංග සූත්‍රය ඇසුරිනි)
12. සදාකාලික සැපනම් රැස් නොකිරීමයි. (සංඛාරුප්පත්ති සූත්‍රය ඇසුරිනි)
13. සැප ලැබෙන පිළිවෙත නම් ....
14. දුක සකස් වෙන පිළිවෙත නම් ....
15. කිතුල්ගොඩ අරණ්‍ය සේනාසනයේ තෙරුවන් වන්දනා පොත.
16. සත්‍ය දකින්නට නම් - 1 (ආනාපානා සතිය - සතිපට්ඨාන සූත්‍රය ඇසුරිනි)
17. සත්‍ය දකින්නට නම් - 2 (ඉරියාපථ පබ්බය - සතිපට්ඨාන සූත්‍රය ඇසුරිනි)
18. සත්‍ය දකින්නට නම් - 3 (සම්පජාන පබ්බය - සතිපට්ඨාන සූත්‍රය ඇසුරිනි)
19. සත්‍ය දකින්නට නම් - 4 (පටික්කූල මනසිකාර පබ්බය - සතිපට්ඨාන සූත්‍රය ඇසුරිනි)
20. සත්‍ය දකින්නට නම් - 5 (ධාතු මනසිකාර පබ්බය - සතිපට්ඨාන සූත්‍රය ඇසුරිනි)
21. සත්‍ය දකින්නට නම් - 6 (පඨම සීවථිකය - සතිපට්ඨාන සූත්‍රය ඇසුරිනි)
22. සත්‍ය දකින්නට නම් - 7 (දුතිය සීවථිකය -සතිපට්ඨාන සූත්‍රය ඇසුරිනි)
23. සත්‍ය දකින්නට නම් - 8 (තතිය සීවථිකය -සතිපට්ඨාන සූත්‍රය ඇසුරිනි)
24. සත්‍ය දකින්නට නම් - 9 (චතුත්ථ සීවථිකය -සතිපට්ඨාන සූත්‍රය ඇසුරිනි)
25. සත්‍ය දකින්නට නම් - 10 (පඤ්චම සීවථිකය -සතිපට්ඨාන සූත්‍රය ඇසුරිනි)
26. සත්‍ය දකින්නට නම් - 11 (ඡට්ඨ සීවථිකය -සතිපට්ඨාන සූත්‍රය ඇසුරිනි)
27. සත්‍ය දකින්නට නම් - 12 (සත්තම සීවථිකය -සතිපට්ඨාන සූත්‍රය ඇසුරිනි)
28. සත්‍ය දකින්නට නම් - 13 (අට්ටම සීවථිකය -සතිපට්ඨාන සූත්‍රය ඇසුරිනි)
29. සත්‍ය දකින්නට නම් - 14 (නවම සීවථිකය -සතිපට්ඨාන සූත්‍රය ඇසුරිනි)
30. IN THE FACE FO DEATH..... (මරණය අබියස ඔබ පරිවර්තනය)
31. The Wonderful Nobel Uposathaya
    (අසිරිමත් ආර්ය උපෝසථය පරිවර්තනය)

# අනුමෝදනාව....

ශ්‍රී.බු.ව. 2561

අසිරිමත් වෙසක් තෙමඟුල නිමිති කරගෙන

මහරගම සිරි වජිරඤාණ ධර්මායතනයේ

මාසික භාවනා සහ සීල සමාදාන වැඩසටහන් වලට

සහභාගීවන පින්වත් පිරිස

සහ

අගලවත්ත, කිතුල්ගොඩ අරණ්‍ය සේනාසනයට

සම්බන්ධ පින්වත් පිරිස

විසින්

මෙම උතුම් සදහම් ග්‍රන්ථය

පරලොව සැපත් ඥාතීන්ට

පිං පිණිසත්,

සෑම දෙනාටම උතුම් ධර්මාවබෝධය

පිණිසත්

මුද්‍රණය කරවා ධර්ම දානයක් වශයෙන්

නොමිලේ බෙදා දෙන ලදී.